# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 26 දරන මුදල් නීති (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 නොවැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

## 1995 අංක 26 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 17 වන දින.]

එල්. ඩී.—ඕ. 83/93

### මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 26 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ Vඅ පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු ය. — **422 වන අධිකාරයේ Vඅ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.**

"Vඅ පරිච්ඡේදය

**මහ බැංකුව විසින් යම් සමාගම්වල කොටස් මිල දී ගැනීම.**

**මහ බැංකුවට සමාගම්වල කොටස් මිල දී ගත හැකි බව.** — 105අ. මේ පනතේ යම් විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද මුදල් මණ්ඩලයේ මතය අනුව ශ්‍රී ලංකාවේ බැංකු හා මූල්‍ය අංශවල මානව සම්පත් හා තාක්ෂණික සංවර්ධනය දියුණු කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා පිහිටුවනු ලැබූ හෝ මේ පනතේ 98 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ 112අ වගන්තියේ සඳහන් පහසුකම් සියල්ලම හෝ ඉන් යම් පහසුකමක් සඳහා විධිවිධාන සලස්වා ඇති යම් සමාගමක කොටස්, මහ බැංකුව විසින් මිල දී ගෙන දරා සිටිය හැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ සහ 112ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— — **ප්‍රධාන ප්‍රඥප්තියේ 112අ සහ 112ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

**"වාණිජ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම්.** — 112අ. මහ බැංකුව විසින්—

(අ) සුරැකුම්පත් ගනුදෙනු බේරුම් කිරීමේ කාර්ය සඳහා, වාණිජ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් මහ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යාම සඳහා ;

(ආ) සහතික රහිත සුරැකුම්පත් ඇරීම, සෘජු සහභාගිකරුවන් අතර සහතික රහිත සුරැකුම්පත් නිෂ්කාශණය කිරීමේ සහ එම ගනුදෙනු

බේරුම් කරමේ කාර්ය සඳහා වාණිජ බැංකු නොවන යම් සෘජු සහභාගි කරුවන ඇතුළුව සෘජු සහභාගකරු වන්ට මහ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යාම සඳහා

පහසුකම් සලසනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා :

“සෘජු සහභාගිකරු” යන්නෙන් ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 21ඇ වගන්තිය යටතේ හෝ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ සෘජු සහභාගිකරුවකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ;

“වාණිජ බැංකුවක් නොවන ප්‍රාථමික අලෙවිකරු” යන්නෙන් වාණිජ බැංකුවක් නොවන ප්‍රාථමික අලෙවිකරුවකු අදහස් වේ;

“ප්‍රාථමික අලෙවිකරු” යන්නෙන් ස්කන්ධ හා සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික හා ද්විතීය වෙළෙඳපළේ ප්‍රතිපත්තිය විශයෙන් මහ බැංකුව සමග ගනුදෙනු කිරීමේ කාර්ය සඳහා මුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස පත් කරන ලද යම් වාණිජ බැංකුවක්, සමාගමක් හෝ වෙනත් යම් තැනැත්තකු අදහස් වේ;

“සහතික රහිත සුරැකුම්පත්” යන්නෙන් සහතික රහිත ආකාරයට නිකුත් කරනු ලබන සුරැකුම්පත් අදහස් වේ;

“සුරැකුම්පත්” යන්නෙන්—

(i) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ විධිවිධාන වලට අනුකූලව සහතික රහිත ආකාරයට හෝ අන්‍යාකාරයකින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්;

(ii) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ විධිවිධාන වලට අනුකූලව සහතික රහිත ආකාරයට හෝ අන්‍යාකාරයකින් නිකුත් කරනු ලබන ලියාපදිංචි ස්කන්ධ හෝ සුරැකුම්පත්;

(iii) සහතික රහිත ආකාරයම හෝ අනන්‍යකාරයකින් මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නම් සුරැකුම්පත්

ඇතුළත් වේ.

98(1) හෝ 112අ වගන්තිය යටතේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා යම් සංස්ථාවක් විසින් පහසුකම් සැලසිය යුතු බව.

112ආ. 98 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් හෝ 112අ වගන්තිය මගින් පවරනු ලැබූ කාර්ය ඉටු කිරීමේ කාර්ය සඳහා, එම වගන්ති වල සඳහන් පහසුකම් සියල්ලම හෝ ඉන් යම් පහසුකමක් සැලසීමට මහ බැංකුව විසින් යම් සංස්ථාවකට බලය පවරනු ලැබිය හැකි ය. ".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය: රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.